# මහාමාර්ග අමාත්‍යාංශය

මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විදේශාධාර ව්‍යාපෘතීන්හි අභ්‍යන්තර විගණක තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම ව්‍යාපෘති මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හි සඳහන් විධිවිධානයන්ට යටත්ව ව්‍යාපෘති කළමනාකරණ ඒකක (PMU) වශයෙන් ස්ථාපිත කොට ඇත.

**තනතුර -**

## අභ්‍යන්තර විගණක -

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති කළමනාකරණ ඒකක සඳහා පුරප්පාඩු අවශ්‍යතාවය මත බඳවා ගැනේ

**තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් පහත දක්වා ඇත.**

**01. අභ්‍යන්තර විගණක (PS 4) (ඇමරිකන් ඩොලර් මිලියන 250ට වැඩි ව්‍යාපෘති සඳහා)**

**අවම සුදුසුකම් සහ පළපුරුද්ද : (පහත 1 හෝ 2)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ගණකාධිකරණ/ විගණන විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලබාගත් මූලික උපාධියක්

හෝ

ගණකාධිකරණ/විගණන විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ උපාධියකට සමාන බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්

හෝ

පිළිගත් වෘත්තීය ආයතනයකින් අදාළ ක්ෂේත්‍රය සම්බන්ධව ලබාගත් වරලත් සාමාජිකත්වය (ආශ්‍රිත) හෝ සමාන වෘත්තීය සුදුසුකමක්

සමග

විගණන විෂය ක්ෂේත්‍රයට අදාලව අවම වශයෙන් වසර 09ක පශ්චාත් සුදුසුකම් සහිත පළපුරුද්ද

02. විගණන විෂය ක්ෂේත්‍රයට අදාළ රජයේ දීප ව්‍යාප්ත සේවාවන් වල හෝ සමාන සේවා තත්ත්වයේ III/II හෝ ඊට ඉහළ පන්තියකට අයත් නිලධරයෙකු වීම

සමග

III/II වන පන්තියේ විගණන ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 09ක පළපුරුද්ද ලබා තිබීම

**02. අභ්‍යන්තර විගණක (PS 4) (ඇමරිකන් ඩොලර් මිලියන 100-250 අතර ව්‍යාපෘති සඳහා)**

**අවම සුදුසුකම් සහ පළපුරුද්ද : (පහත 1 හෝ 2)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ගණකාධිකරණ/ විගණන විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලබාගත් මූලික උපාධියක්

හෝ

ගණකාධිකරණ/විගණන විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ උපාධියකට සමාන බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්

හෝ

පිළිගත් වෘත්තීය ආයතනයකින් අදාළ ක්ෂේත්‍රය සම්බන්ධව ලබාගත් වරලත් සාමාජිකත්වය (ආශ්‍රිත) හෝ සමාන වෘත්තීය සුදුසුකමක්

සමග

විගණන විෂය ක්ෂේත්‍රයට අදාලව අවම වශයෙන් වසර 08ක පශ්චාත් සුදුසුකම් සහිත පළපුරුද්ද

02. විගණන විෂය ක්ෂේත්‍රයට අදාළ රජයේ දීප ව්‍යාප්ත සේවාවන් වල හෝ සමාන සේවා තත්ත්වයේ III/II හෝ ඊට ඉහළ පන්තියකට අයත් නිලධරයෙකු වීම

සමග

III/II වන පන්තියේ විගණන ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 08ක පළපුරුද්ද ලබා තිබීම

**කොන්දේසි**

**01. වයස් සීමාව :**

ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු අවසාන දිනට වයස අවුරුදු 64 ට අඩු විය යුතුය.

**02. වැටුප :**

මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 මත පදනම්ව ගෙවනු ලැබේ.

**03. සේවා කොන්දේසි :**

මූලිකව වසර 1 ක කාලපරිච්ඡේදයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත පත්කරනු ඇත. කාර්ය සාධනය මත පදනම්ව සේවය දීර්ඝ කිරීම සලකා බැලිය හැකි වනු ඇත.

**04. වෙනත් ප්‍රතිලාභ :**

සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේවකයා විසින් දායක කරනු ලබන 8% සඳහා ව්‍යාපෘතිය විසින් 12% ක් දායක කරනු ඇති අතර, සේවක භාරකාර අරමුදල සඳහා 3% ක අතිරේක දායකත්වයක් සපයනු ඇත.

සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් අදාළ තොරතුරු පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරමින් අයදුම්කරු පිළිබඳව තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් ද සහිතව සකස් කරන ලද අයදුම්පත් 2021.01.25 දිනට පෙර **ලේකම්, මහාමාර්ග අමාත්‍යාංශය, "මගනැගුම මහමැදුර", අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"අභ්‍යන්තර විගණක තනතුර සඳහා අයදුම් කිරීම (ඇමරිකන් ඩොලර් මිලියන 250ට වැඩි) හෝ (ඇමරිකන් ඩොලර් මිලියන 100-250 අතර)"** යන්න සඳහන් කළ යුතුය. තවද ඉදිරිපත් කරන ඉල්ලුම්පත්‍ර මහාමාර්ග අමාත්‍යාංශයීය වෙබ් අඩවිය වන mohsl.gov.lk වෙබ් අඩවියෙන් බාගත කරගෙන සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය. දැනටමත් රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, මණ්ඩල සහ අධිකාරීන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් ව්‍යාපෘති තනතුර සඳහා මේ වන විට සේවයේ යෙදී සිටින නිත්‍ය තනතුරින් නිදහස් කිරීමේ එකඟතාවය පැහැදිලිව සඳහන් කරමින් අදාළ ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතුය. ඉල්ලුම්පත්‍රය සමඟ අදාළ සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර, එසේ නොඑවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ඇත.

**ලේකම්,**

**මහාමාර්ග අමාත්‍යාංශය.**

Source: Dinamina, Daily News (2021.01.11)